සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

18475

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (✕) ලකුණ යොදන්න.

(01) මහාවංසයෙහි අර්ථ විවරණය සඳහා රචනා කොට ඇති ග්‍රන්ථය මින් කුමක් ද?

(1) සීහලට්ඨකථා මහාවංසය (2) වංසත්ථප්පකාසිනිය
(3) සමන්තපාසාදිකාව (4) රසවාහිනිය

(02) ගල් යුගයේ ප්‍රජාව පිළිබඳ තොරතුරු ලබාගත හැකි අත්තනගොඩ අළුලෙන පිහිටා ඇත්තේ කුමන පරිසර කලාපයකට අයත්ව ද?

(1) අර්ධ ශුෂ්ක කලාපයට (2) පහතරට වියළි කලාපයට
(3) පහතරට අතරමැදි වියළි කලාපයට (4) තෙත් කලාපයට

(03) මුල් ඓතිහාසික යුගයේ මෙරට ජනාවාස ව්‍යාප්තව පැවති ප්‍රදේශ පෙන්නුම් කරන ප්‍රධාන දර්ශකය වන්නේ,

(1) ගල් ගුහාවල ව්‍යාප්තියයි. (2) සෙල්ලිපිවල ව්‍යාප්තියයි.
(3) මහ වැව්වල ව්‍යාප්තියයි. (4) කුඩා වැව්වල ව්‍යාප්තියයි.

(04) දේවානම්පියතිස්ස රජ දවස දේශපාලන බලය මධ්‍යගත වීමේ අවශ්‍යතාවය වර්ධනය වීමට බලපෑ වැදගත් ම සාධකය මින් කුමක් ද?

(1) සියලුම ප්‍රාදේශීය පාලකයන් අතර සුහදතාවය ගොඩනැගීමට
(2) අශෝක රජු හා දේවානම්පියතිස්ස රජු අතර පැවති සබඳතා වර්ධනය කිරීමට
(3) ඉන්දියන් සාගර කලාපයේ වර්ධනය වූ වෙළඳාමට ස්වාධීනව සම්බන්ධ වීමට
(4) පංචකකුධ භාණ්ඩ භාවිත කරමින් නැවත අභිෂේකය ලැබීමට

(05) රාජ්‍ය උරුමය පියාගෙන් පුතාට හිමිවීම පිළිබඳව දිය හැකි උදාහරණය කුමක් ද?

(1) දුටුගැමුණු රජුගෙන් පසු සද්ධාතිස්ස රජුට
(2) වසභ රජුගෙන් පසු වංකනාසිකතිස්ස රජුට
(3) දේවානම්පියතිස්ස රජුගෙන් පසු උත්තිය රජුට
(4) යසලාලකතිස්ස රජුගෙන් පසු සුභ රජුට

(06) - ළමා කාලයේ වනගතව රැකවරණය සලසා ගැනීම
- චෝළ පාලකයින් පරදා රට එක්සත් කිරීම
- ඉන්දියන් සාගරයේ නැගෙනහිර කොටස සමඟ සබඳතා පැවැත්වීමට පරිපාලනය සංවිධානය කිරීම
- බෞද්ධ වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම

ඉහත සඳහන් තොරතුරුවලට ගැළපෙන රජතුමා කවුරුන් ද?

(1) දුටුගැමුණු රජු
(2) වසභ රජු
(3) පළමුවන විජයබාහු රජු
(4) පළමුවන පරාක්‍රමබාහු රජු

(07) ජනතාවගේ සෞඛ්‍ය පහසුකම් නගා සිටුවීමට දායකත්වය ලබාදුන් රජවරු පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) පස්වන මහින්ද රජු, බුද්ධදාස රජු, හතරවන කාශ්‍යප රජු
(2) භාතිකාභය රජු, පළමුවන ගජබාහු රජු, වසභ රජු
(3) වසභ රජු, හතරවන කාශ්‍යප රජු, පළමුවන උපතිස්ස රජු
(4) පස්වන මහින්ද රජු, බුද්ධදාස රජු, තුන්වන උදය රජු

(08) පහත දී ඇති "අ" තීරුවේ විවිධ ශිල්පීන් හා "ආ" තීරුවේ ඔවුන් පිළිබඳව සඳහන්වන සෙල්ලිපි දක්වා ඇත. ඒවා නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. කම්මල්කරුවන් | A. මණ්ඩගල සෙල්ලිපිය |
| 2. ඇත්දත් ශිල්පීන් | B. වෙහෙරකෙම සෙල්ලිපිය |
| 3. රන්කරුවන් | C. මුතුගල්ල සෙල්ලිපිය |
| 4. නූල්කටින්නන් | D. සීගිරි ජල උද්‍යාන සෙල්ලිපිය |
| | E. වේගිරිය දේවාල සෙල්ලිපිය |

(1) CAED
(2) CEAB
(3) ACBE
(4) BCAE

(09) වෙළදාමේ සාර්ථකත්වය සඳහා චීනය සමඟ වඩාත් ශක්තිමත් සබඳතා ගොඩනගාගත් රජු කවුරුන් ද?

(1) හයවන අග්ගබෝධි රජු
(2) පස්වන කාශ්‍යප රජු
(3) දෙවන කාශ්‍යප රජු
(4) දෙවන අග්ගබෝධි රජු

(10) ආභරණ සැකසීමේ තාක්ෂණික විශිෂ්ටත්වය විදහාපාන සියුම් කැටයම් සහිත රන්තැල්ලක කොටසක් හමුවී ඇත්තේ කුමන ස්ථානයෙන් ද?

(1) මහා විහාරයෙන්
(2) අභයගිරි විහාරයෙන්
(3) ගල් විහාරයෙන්
(4) ජේතවන විහාරයෙන්

(11) උස් බැම්මක් සහිත වැව්වල සොරොව් එකකට වඩා වැඩි ප්‍රමාණයක් සවිකර තිබීමේ අරමුණ වූයේ කුමක් ද?

(1) විශාල ජල ප්‍රමාණයක් ඇළ මාර්ගවලට මුදාහැරීම
(2) වැවේ තැන්පත් වූ රොන්මඩ සියල්ල ඉවත් කිරීම
(3) ජලය මුදාහැරීමේ දී අවම පීඩනයක් යටතේ ජලය පිටතට ගෙන ඒම
(4) ජලය පිරුණු විටක දී ඉතා ඉක්මනින් එම ජලය ඉවත්කර ගැනීම

(12) පැරණි වාස්තු විද්‍යාඥයින් මහල් ගොඩනැගිලි නිර්මාණයේ නිපුණත්වයක් දැක්වූවන් බව සනාථ කරන සාධකයක් වන්නේ,

(1) ඉසුරුමුණි විහාරය
(2) ලෝවාමහාපාය
(3) ජේතවනාරාමය
(4) අභයගිරි විහාරය

(13) ආලාහන පිරිවෙන කැණීම්වලින් ලබාගත් සාධක අනුව එහි පැවති රෝහල විශේෂ වී ඇත්තේ,

(1) ශල්‍යකර්ම සිදු කිරීම සඳහා ය.
(2) අක්ෂි වෛද්‍ය විද්‍යාව සඳහා ය.
(3) සර්ප විෂ වෙදකම සඳහා ය.
(4) උණ රෝගීන්ට ප්‍රතිකාර කිරීම සඳහා ය.

(14) රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද හැඳින්වූයේ කුමන නමකින් ද?

(1) මතරමජ්බක
(2) දකපති
(3) කෙටුකනබ
(4) බොජකපති

(15) කොන්ඩවට්ටවාන් ටැම්ලිපිය අනුව නිසි කලට සීසෑම නොකරන පුද්ගලයින්ගෙන් දඩ මුදල් අයකර ඇත්තේ කුමන හේතුවක් නිසා ද?

(1) සෑම කෙනෙක් ම සීසෑම සිදුකළ යුතු නිසා
(2) වැසිකාලයේ සීසෑමෙන් පස සෝදායාමට ලක්වන නිසා
(3) වීවගාව ප්‍රධාන ජීවනෝපාය මාර්ගය වීම නිසා
(4) කෘෂිකාර්මික කටයුතු මැනවින් පවත්වාගෙන යායුතු නිසා

(16) නිරිතදිග රාජධානි සමයේ ගෘහනිර්මාණවල දක්නට ලැබුන සුවිශේෂී ලක්ෂණය වූයේ කුමක් ද?

(1) ගෘහනිර්මාණවලට දකුණු ඉන්දියානු ආභාසය ලැබීමයි.
(2) ආගමික මෙන්ම ආගමික නොවන ගෘහනිර්මාණ ද ඉදිවීමයි.
(3) ගෘහනිර්මාණ සඳහා රාජ්‍ය අනුග්‍රහය නොමඳව ලැබීමයි.
(4) ආගමික ගොඩනැගිලි පමණක් ඉදිවීමයි.

(17) - වන්නි නායකවරුන්ගේ කැරලි මර්දනය කිරීම
- චෝඩගංග හා කාලිංගරායරගේ ආක්‍රමණවලට මුහුණදීම
- ඊජිප්තුව සමඟ විදේශ සබඳතා පැවැත්වීම

ඉහත සිද්ධීන් හා සම්බන්ධ රජු වන්නේ මින් කවුරුන් ද?

(1) තුන්වන විජයබාහු රජු
(2) දෙවන බුවනෙකබාහු රජු
(3) පළමුවන බුවනෙකබාහු රජු
(4) තෙවන පරාක්‍රමබාහු රජු

(18) පළමුවන විමලධර්මසූරිය රජුට මුහුණදීමට සිදුවූ අභියෝගයක් නොවන පිළිතුර තෝරන්න.

(1) උඩරට රාජ්‍යය පෘතුගීසීන්ගෙන් ආරක්ෂා කරගැනීම
(2) උඩරට රාජ්‍යය ලන්දේසීන්ගෙන් රැකගත යුතුවීම
(3) උඩරට රාජ්‍යයේ නීත්‍යානුකූල අයිතිය ලබාගත යුතු වීම
(4) පරිහානියට පත් බුදු දහම නගා සිටුවිය යුතු වීම

(19) ඉංග්‍රීසීන් ලංකාවේ වෙරළබඩ ප්‍රදේශ තමන් යටතට පත්කරගන්නා විට උඩරට රජු වූයේ කවුරුන් ද?

(1) ශ්‍රී වික්‍රමරාජසිංහ රජු
(2) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජු
(4) රාජාධිරාජසිංහ රජු

(20) පහත A B C D යටතේ දක්වා ඇති සිදුවීම් අනුපිළිවෙළ අනුව පෙළගැස්වූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

A - කීර්ති ශ්‍රී රාජසිංහ රජු ලන්දේසීන් සමඟ ගිවිසුමක් ඇතිකර ගැනීම

B - භුවනෙකබාහු රජු මරණයට පත්වීම

C - එදිරිමානසිංහම් යාපනයේ රජවීම

D - පෘතුගීසීන් සමඟ මුල්ලේරියාවේ සටනක් සිදුවීම

(1) BDAC (2) ACBD (3) BDCA (4) DBCA

(21) පහත "අ" සහ "ආ" තීරු දෙක නිවැරදිව ගැළපූ විට ලැබෙන පිළිතුර තෝරන්න.

| "අ" | "ආ" |
|---|---|
| 1. දන්තුරේ සටන | A. කොන්ස්තන්තීනුද සා |
| 2. බලන සටන | B. අපොන්සු පෙරෙයිරාද ලසර්දා |
| 3. රන්දෙනිවෙල සටන | C. පේරෝ ලොපෙස්ද සූසා |
| 4. ගන්නෝරුව සටන | D. දියෝගු ද මෙලෝ |
| | E. දොන් ජෙරොනිමෝද අසවේදු |

(1) CEAD (2) DBAC (3) ACBD (4) CAED

(22) ක්‍රි.ව. 1762 කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවීමට පැමිණි ඉංග්‍රීසි දූත කණ්ඩායමේ නායකයා කවුරුන් ද?

(1) ජෝන් ඩොයිලි (2) ජෝන් ෆයිබස්

(3) හියුබොයිඩ් (4) රොබට් ඇන්ඩෲස්

(23) පහත දැක්වෙන තොරතුරු අතුරින් බ්‍රිතාන්‍යයන්ට ශ්‍රී ලංකාව යටත්කර ගැනීමේ අවශ්‍යතාවය ඇතිවීමට බලපෑ ප්‍රධාන හේතු ඇතුළත් පිළිතුර තෝරන්න.

A. තේ වගාවට සුදුසු ඉඩම් තිබීම

B. ප්‍රංශ ජාතිකයන්ට වඩා, ලාභදායී වෙළඳාමක් සිදුකිරීම

C. ත්‍රිකුණාමල වරාය ලොව අද්විතීය වරායක් වීම

D. ලංකාවේ වටිනා වෙළඳ ද්‍රව්‍ය තිබීම

(1) A හා B (2) C හා B (3) A හා D (4) C හා D

(24) ක්‍රි.ව. 1848 බ්‍රිතාන්‍ය විරෝධී නිදහස් සටනට බලපෑ ආසන්නම හේතුව ලෙස දැක්විය හැක්කේ,

(1) රජය ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමයි.

(2) අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීමයි.

(3) ටොරින්ටන් සාමිවරයා නව බදු පැනවීමයි.

(4) සිවිල් නිලධාරීන්ට වතු වගාවේ යෙදීමට අවසර දීමයි.

(25) මාළිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන පිහිටුවීමට මූලික වූ භික්ෂූන් වහන්සේ කවුරුන් ද?

(1) රත්මලානේ ධම්මාලෝක හිමි (2) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි

(3) වලානේ සිද්ධාර්ථ හිමි (4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

(26) ඉංග්‍රීසි ආණ්ඩුව 1915 දී යුද්ධ නීතිය පනවා බෞද්ධයින් දැඩි මර්දනයට ලක්කළ අවස්ථාවේ බෞද්ධයින් වෙනුවෙන් හඬ නැගූ පුද්ගලයා කවුරුන් ද?

(1) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි (2) පොන්නම්බලම් අරුණාචලම් මහතා

(3) පොන්නම්බලම් රාමනාදන් මහතා (4) සිද්දිලෙබ්බේ මහතා

(27) කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලට සංශෝධනයක් සිදුකිරීමේ උද්ඝෝෂණයක් මුල්වරට කරන ලද්දේ,
(1) උගත් ලාංකිකයින් විසිනි.
(2) අමද්‍යප ව්‍යාපාරයේ සාමාජිකයින් විසිනි.
(3) ලංකා ජාතික සංගමයේ සාමාජිකයින් විසිනි.
(4) යුරෝපීය ව්‍යාපාරිකයින් විසිනි.

(28) ව්‍යවස්ථාදායක සභාවට ඡන්ද බලයෙන් නියෝජිතයින් පත්කිරීමේ අවස්ථාව ශ්‍රීලාංකිකයින්ට ප්‍රථම වරට ලැබුණේ කුමන ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් ද?
(1) කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලිනි. (2) මැකලම් ප්‍රතිසංස්කරණවලිනි.
(3) මැනිං ප්‍රතිසංස්කරණවලිනි. (4) ඩොනමෝර් ප්‍රතිසංස්කරණවලිනි.

(29) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා මහත් කැපවීමක් කළ දේශීය නායකයා කවුරුන් ද?
(1) ඩී.බී.ජයතිලක මහතා (2) එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා
(3) ඩී.එස්.සේනානායක මහතා (4) එෆ්.ආර්.සේනානායක මහතා

(30) වතුවගාව නිසා මෙරට ආර්ථිකයේ ඇතිවූ ප්‍රබලම වෙනස්කම කුමක් ද?
(1) යැපුම් කෘෂිකර්මාන්තය පිරිහීම (2) ධනපති හා කම්කරු පන්තිභේදය ඇතිවීම
(3) ආනයන අපනයන ආර්ථිකයකට යොමුවීම (4) අපනයන විවිධාංගීකරණය ඇතිවීම

(31) ක්‍රි.ව. 1947 දෙසැම්බර් 19 වන දිනය ශ්‍රී ලාංකිකයින්ට වැදගත් වන්නේ කුමන කරුණක් නිසා ද?
(1) ආරක්ෂක හා බාහිර කටයුතු පිළිබඳ ගිවිසුම් අත්සන් කිරීම
(2) ලංකා ස්වාධීනතා රාජාඥාව නිකුත් කිරීම
(3) ලංකාවේ නව පාර්ලිමේන්තුව උත්සවාකාරයෙන් විවෘත කිරීම
(4) ලංකාවේ ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වීම

(32) ශ්‍රී ලංකාවේ අධිකරණ සේවා කොමිෂන් සභාව පිළිබඳ නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවෝ දෙදෙනෙක්ගෙන් සමන්විත වන අතර අග්‍රවිනිශ්චයකාරවරයා සභාපති වේ.
(2) අධිකරණ ඇමතිවරයා සභාපති වන අතර ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් තිදෙනෙක් සිටී.
(3) මහාධිකරණ විනිසුරුවන් දහදෙනෙකුගෙන් සමන්විත වේ.
(4) අග්‍ර විනිශ්චයකාරවරයා සභාපති වන අතර ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවන් පස් දෙනෙකුගෙන් සමන්විත ය.

(33) පුනරුද සමයේ දේශපාලන ක්ෂේත්‍රයේ සිදුවූ ප්‍රබල වෙනස මින් කුමක් ද?
(1) ප්‍රාදේශීය රාජ්‍යවලට බලතල බෙදීයාම (2) ජාතික රාජ්‍ය බිහිවීම
(3) රාජාණ්ඩු බිඳ වැටීම (4) දේශගවේෂණ ව්‍යාපාර ඇතිවීම

(34) ප්‍රතිමා කලාවේ අග්‍රගණ්‍ය නිර්මාණයක් වන පියෙටා ප්‍රතිමාව නිර්මාණය කර ඇත්තේ කවුරුන් විසින් ද?
(1) රෆායල් සැන්ඩි (2) ලියනාඩෝ ඩාවින්චි
(3) බොට්ටි චෙල්ලි (4) මයිකල් ආන්ජිලෝ



18478

(35) කාර්මික විප්ලවය හා සම්බන්ධ සිදුවීම් කිහිපයක් පහත දැක්වේ. ඒවාට අදාළ පුද්ගලයින්ගේ නම් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

- පේළි වැපිරීමේ ක්‍රමය
- ජලරාමුව නිපදවීම
- යපස් උණුකිරීමේ විදුලි උදුන නිපදවීම
- සත්ත්ව පාලනයට නව තාක්ෂණික ක්‍රම යොදාගැනීම

(1) රොබට් බැක්වෙල්, ජෙත්රෝටල්, රිචඩ් ආර්ක්රයිට්, විලියම් සීමන්ස්
(2) ජෙත්රෝටල්, රිචඩ් ආර්ක්රයිට්, විලියම් සීමන්ස්, රොබට් බැක්වෙල්
(3) රිචඩ් ආර්ක්රයිට්, විලියම් සීමන්, ජෙත්රෝටල්, රොබට් බැක්වෙල්
(4) රොබට් බැක්වෙල්, රිචඩ් ආර්ක්රයිට්, විලියම් සීමන්ස්, ජෙත්රෝටල්

(36) යුරෝපයේ කාර්මීකරණය වීමත් සමඟ ඇතිවූ ප්‍රධානතම සමාජීය ප්‍රතිඵලය කුමක් ද?
(1) සැපවත් විනෝදකාමී සමාජයක් බිහිවීම
(2) සමාජයේ සියලු ම දෙනා ධනවතුන් වීම
(3) පන්ති සහිත සමාජයක් බිහිවීම
(4) සමාජ අපචාර වැඩිදියුණු වීම

- අදහස් යුගලය බැගින් පහත දී ඇත. සෑම යුගලයක් ම පළමුවැන්න හා දෙවැන්න කෙරෙහි බලපාන ආකාරය සලකා බලා අංක 37 - 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A 1. වර්ජිනියා
2. ජෝර්ජියා

B 1. බොස්ටන් තේ සාදය
2. ඇමරිකන් විප්ලවය

C 1. කැපිටේෂන්
2. ගැබෙල්

D 1. ආක්‍රමණ නොසලකා හැරීම
2. ජාතීන්ගේ සංගමය

E 1. නට්සිවාදය
2. බෙනිටෝ මුසොලිනි

(37) පළමුවැන්න නිසා දෙවැන්නෙහි ආරම්භය සිදුවිය.
(1) A (2) B (3) C (4) E

(38) පළමුවැන්නෙන් ආරම්භ වූ අතර දෙවැන්නෙන් අවසන් විය.
(1) A (2) B (3) C (4) D

(39) පළමුවැන්න නිසා දෙවැන්න අසාර්ථක විය.
(1) A (2) C (3) D (4) E

(40) පළමුවැන්න හා දෙවැන්න අතර කිසිදු සම්බන්ධයක් නැත.
(1) B (2) C (3) D (4) E

18476

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 11 | විෂයය / பாடம் / Subject | ඉතිහාසය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 03 |
|---|---|---|---|---|---|---|---|

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

## I කොටස

(01) (අ) පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියමෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) ගෝකණ්ණතිත්ථ, කළු ගඟ, දඹකොළ පටුන, රංචාමඩම, ගාල්ල, මහනුවර, ගම්පොළ, ගල්ඔය ජලාශය, යාපහුව, හුරුළු වැව, පොළොන්නරුව, පොම්පරිප්පු (ලකුණු 12)

(ii) බ්‍රිතාන්‍ය, රතු මුහුද, මලක්කා සමුද්‍ර සන්ධිය, හිරෝෂිමා, වැනීසිය, පිලිපීනය (ලකුණු 06)

(ආ) (i) පහත A, B, C, D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු හා සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - දැදිගම ප්‍රදේශයේ ඉපදී පොළොන්නරුවේ රාජ්‍යත්වයට පත්වූ රජතුමා


B - ගම්පොළ රාජ්‍ය සමයේ ලංකාවට පැමිණ ශ්‍රීපාදය වන්දනාවට ගිය අරාබි සංචාරකයා

C - 1941 වර්ෂයේ අත්ලන්තික් ප්‍රඥප්තියට අත්සන් තැබූ ඇමරිකා එක්සත් ජනපදයේ ජනාධිපතිවරයා

D - රුසියානු බොල්ෂෙවික්වරුන්ගේ නායකයා (ලකුණු 04)

- A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

(ii) (1) A වලින් දක්වා ඇති රූපය නම් කරන්න.
(2) මෙය කුමන වර්ගයට අයත් සෙල්ලිපියක් ද?
(3) මෙය කරවන ලද රජතුමා නම් කරන්න.
(4) මෙය කුමන රාජධානියකට අයත්දැයි ලියන්න.
(ලකුණු 04)


A රූපය

(iii) (1) B වලින් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
(2) මොහු කුමන ජාතිකයෙක් ද?
(3) මොහුගේ ක්‍රියාකලාපය නිසා ඇතිවූ යුද්ධය කුමක් ද?
(4) ඔහු විසින් රචිත ප්‍රසිද්ධ කෘතිය නම් කරන්න.
(ලකුණු 04)


B රූපය

## II කොටස

(02) (i) පහත A, B, C යටතේ දක්වා ඇති වෘත්තිකයින් විසූ ගම් හැඳින්වූ නම් අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - වඩුවන් B - ධීවරයන් C - ගොවියන් (ලකුණු 03)

(ii) පූර්ව ඓතිහාසික යුගයේ දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පැරණි සමාජය තුළත් බුදුදහමට අමතරව වෙනත් ආගම් ද පැවති බව උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) විවිධ ජීවනෝපාය මාර්ගයන් පැරණි සමාජය තුළ ක්‍රියාත්මක වූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(03) (i) පහත සඳහන් තොරතුරු දැක්වෙන මූලාශ්‍රය A B C අනුපිළිවෙළින් නම් කරන්න.

A - ගමික ගෘහපතීන් අතරින්ම පත්වූ බව

B - ගෘහපතීන් වත්පොහොසත්කම් සහිත පුද්ගලයින් බව

C - ප්‍රාදේශීය පාලකයකු දූහතර රජ නමින් හැඳින්වීම (ලකුණු 03)

(ii) ගමිකගෙන් ඉටුවූ කාර්යයන් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) දේශපාලන බලය මධ්‍යගත කරමින් බිහිවූ මහරජු විසින් ජනතාවට ඉටුකළ යුතු යුතුකම් දෙකක් උදාහරණ දෙමින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) මෙරට පාලනය කළ ශ්‍රේෂ්ඨ රජෙකු වශයෙන් දුටුගැමුණු රජුගේ වැදගත්කම කරුණු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(04) (i) පහත A B C ප්‍රකාශන හා සම්බන්ධ ස්ථාන පිළිවෙළින් ලියා දක්වන්න.

A - ප්‍රාග් ඓතිහාසික යුගයේ වැසියන් කැලෑදෙල් ඇට පුළුස්සා ආහාරයට ගත් බවට සාක්ෂි හමුවන ස්ථානය

B - තිස්ස නම් විහාරයට කරිස අටක ඉඩමක් පූජා කළ බව සඳහන් කුටකණ්ණ අභය රජුට අයත් සෙල්ලිපිය හමුවූ ස්ථානය

C - කාන්තාවන්ගේ ඇස් පිහාටු වර්ණ ගැන්වීම සඳහා භාවිත කරන ලද ලෝහකූරක් හමුවූ ස්ථානය (ලකුණු 03)

(ii) අතීතයේ කාලය මැනීමට යොදාගත් මිනුම් වර්ග හතරක් නම් කරන්න. (ලකුණු 04)

(iii) අපේ රටේ පැරණි සමාජයේ ජීවත් වූ වැසියන්ගේ විශ්මිත දැනුමේ ස්වභාවය ජල කළමනාකරණය තුළින් මනාව ඔප්පුවන බව උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පැරණි කාලයේ කාන්තාවන්ට සමාජයේ ගෞරවනීය ලෙස සලකා ඇති ආකාරය මූලාශ්‍ර උදාහරණයට ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(05) (i) පළමු නාගරීකරණය යටතේ බිහිවූ නගර තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත ප්‍රකාශන හා සම්බන්ධ පුද්ගලයින් ABCD පිළිවෙළින් ලියා දක්වන්න.

A - යාපන රාජධානියේ ආරම්භක පාලකයා

B - කව්සිළුමිණ නම් මහා කාව්‍ය රචනා කිරීම

C - අටවන වීරපරාක්‍රමබාහු නමින් රජවීම

D - කෝට්ටේ ශක්තිමත් බලකොටුවක් පිහිටුවීම (ලකුණු 04)

(iii) හයවන පරාක්‍රමබාහු රජතුමාගෙන් ඉටුවූ සේවාවන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) පළවෙනි විමලධර්මසූරිය රජතුමා මුහුණ දුන් අභියෝග තුනක් නම් කර ඒවා ජයගැනීමට කටයුතු කළ අයුරු විස්තර කරන්න. (ලකුණු 06)

(06) (i) පහත A B C යටතේ දක්වා ඇති කරුණුවලට ගැළපෙන පුද්ගලයින් අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම පෘතුගීසි ජාතිකයා

B - ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ලන්දේසි ජාතිකයා

C - ශ්‍රී ලංකාවට පැමිණි ප්‍රථම ඉංග්‍රීසි ජාතිකයා (ලකුණු 03)

(ii) පෘතුගීසීන්ට ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල බලය ව්‍යාප්ත කිරීම පහසුවීමට බලපෑ කරුණු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) උඩරට රාජධානිය පෘතුගීසීන්ට යටත්කර ගැනීමට නොහැකිවීමට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) උඩරට රාජධානිය සමඟ ලන්දේසීන් සබඳතා පැවැත්වූ ආකාරය කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(07) (i) පහත A B C යටතේ දක්වා ඇති කාර්යයන් සම්බන්ධ පුද්ගලයින් කවුරුන්දැයි අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - ක්‍රි.ව.1815 උඩරට ආක්‍රමණයට පසුබිම සකස් කළ ඉංග්‍රීසි සිවිල් සේවකයා

B - ක්‍රි.ව. 1848 නව බදු වර්ග රැසක් පැනවූ ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා

C - ක්‍රි.ව. 1908 වර්ෂයේ මුල්වරට විධිමත් පෙත්සමක් යටත් විජිත ලේකම් වෙත ඉදිරිපත් කළ නායකයා (ලකුණු 03)

(ii) ශ්‍රී ලංකාවේ ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසීන්ගේ අවධානය යොමුවීමට බලපෑ කරුණු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) ක්‍රි.ව. 1848 දෙවන නිදහස් සටනට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කෝල්බෲක් ප්‍රතිසංස්කරණවලින් ඉදිරිපත්වූ යෝජනා තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

(08) (i) පුනරුද සමයේ විශිෂ්ඨ කලා නිර්මාණ ඉදිරිපත් කළ ශිල්පීන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) යුරෝපයේ පුනරුදය ඇතිවීමට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) නව වෙළෙඳ මාර්ග සොයා යාමේ ගමන යුරෝපීයන්ට සාර්ථක කර ගැනීමට බලපෑ සාධක දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කාර්මික විප්ලවය නිසා සමාජ ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(09) (i) ක්‍රි.ව. 1764 - 1765 කාලයේ දී බ්‍රිතාන්‍යයින් විසින් ඇමරිකානුවන්ට පනවන ලද පනත් තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) පහත අසා ඇති තොරතුරු අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A - "රාජ්‍ය නම් මමයි" යැයි ප්‍රකාශ කළ රජ

B - රුසියාවේ සාර් පාලනය බිඳ වැටීමෙන් පසු බලයට පත්වූ නායකයා

C - ප්‍රංශ සිරකරුවන් රැඳවූ බන්ධනාගාරය

D - ජනතා ස්වාධිපත්‍යය පිළිබඳ සංකල්පය ඉදිරිපත් කළ රූසෝගේ ග්‍රන්ථය

(ලකුණු 04)

(iii) පළමුවන ලෝක යුද්ධයට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) ලෝක සාමය ආරක්ෂා කිරීම සඳහා පිහිටවූ ජාතීන්ගේ සංගමය අසාර්ථක වීමට බලපෑ හේතු තුනක් විස්තර කරන්න. (ලකුණු 06)

The National e-learning Portal for The General Education